දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය - Faculty of Humanities & Social Sciences

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2018 පරීක්ෂණය (2015 පුනර්) - 2018 සැප්තැම්බර්/ඔක්තෝබර්

First Examination in Arts (External) 2018 (Repeat 2015) – September/October 2018

සිංප්‍ර 1.1 - සිංහල භාෂා ප්‍රවේශය

SL 1.1 – Approach to the Sinhala Language

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය

---

01. සිදත් සඟරා වර්ණමාලාව පිළිබඳ හඳුන්වා, සිංහල වර්ණමාලාවෙහි විකාසය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක යෙදෙන්න.

02. විබත් සමස් (විභක්ති සමාසය) පිළිබඳ සිදත් සඟරා විග්‍රහය දක්වා එහි ප්‍රභේද සාකච්ඡා කරන්න.

03. “කිරිය නිපැත්මට හේනෙන් මෙසය කරු නම්
සබඳ අලපෝ බිහි වූ මෙවෙනි අයුරක් නොලදින්”
මෙම පාඨය ආශ්‍රයෙන් කාරක පිළබඳ විග්‍රහයක යෙදෙන්න.

04. ධාතු ප්‍රකෘති (දා පියෙවි) හෙවත් ක්‍රියා ප්‍රකෘති සඳහා පවතින වර්ගීකරණ පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

05. “නොදැවි නොගුණ දැවි නිසා සකරුණෙන් දාමුව සිදුකිරිය නම්” මෙම සිදත් සඟරා නිර්වචනය ද පාදක කොටගෙන සිංහල භාෂාවේ ක්‍රියාපද හඳුන්වා ප්‍රයෝජ්‍ය ක්‍රියා (පියදු කිරිය) සනිදර්ශනව විභාග කරන්න.

06. අභිමත මාතෘකා දෙකක් (02) සනිදර්ශනව සාකච්ඡා කරන්න.

i. අව්‍යය පද
ii. අවධි විභක්තිය (අවදි විබත)
iii. ක්‍රියා විශේෂණ
iv. අස්ත්‍යර්ථයෙහි තද්ධිත ප්‍රත්‍යය

07. පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.

i. තෙපි කිනම්හු ද? මාතලී රියදුරා නම් මම ය.

ii. නාගරික මධ්‍යම පාන්තික ඇතැම් දරුවන් සිය දෙමව්පියෝ ඇමතීමට 'අම්මි', 'තාත්ති' යන වචන භාවිත කෙරේ.

iii. වෙදදුරෝ විසින් සිසුහු ලවා ලෙඩුන් බලවනු ලැබෙයි.

iv. නිංගී ද තෝ ද මා ද විනෝද චාරිකාවට සහභාගී වූහ.

v. පෙර ධනකුවේරයෝ වූ ඔවුන් අද අසරණව මහමඟ යදිති.

vi. පියෙක් බඳු ගුරුතුමාණෝ අසරණ අපි රැකබලා ගත්තෝය.

vii. පාලකයෝ කැරලිකරුවෝ තුවක්කුවෙන් මර්දනය කරාවි.

viii. විශ්වවිද්‍යාලයීය බුද්ධිමත්හු නිවට වීම ඔවුනට නොසැහෙති.

ix. සියලු ඥාතිමිත්‍රාදීන් ප්‍රමාද වූ මෙම නිවේදනය කාරුණිකව පිළිගනීවා!

x. ඔවුහු විසින් ව්‍යසනප්‍රාප්ත බොහෝ සතුන් සුවපත් කරන ලදී.

08. පහත සඳහන් වාක්‍යවලට අදාළ උක්තාඛ්‍යාත පද සම්බන්ධ රීති කෙටියෙන් පැහැදිලි කරන්න.

i. පලදායී <u>උපාධිධාරියෙකු</u> වන්නේ <u>කෙසේ ද</u>?

ii. සිදු වී ඇති අපරාධය ගැන මේ අයගෙන් <u>එක්කෙනෙක්</u> බොරු <u>කියයි</u>.

iii. <u>කාශ්‍යපයන්</u> සටනින් <u>පැරදුනහ යි</u> සිතූ සතුරෝ පලා ගියහ.

iv. බාහිර උපාධිය හොඳින් සමත්වීම සඳහා අපට දක්ෂ <u>ගුරුවරු</u> <u>නැත</u>.

v. <u>තෝ</u> ඉඳින් උන් කරා <u>ගියෙහි</u> නම් තාගේ යසස් පිරිහෙයි.

vi. <u>කියත</u> <u>උන්</u> මෙතෙපල ආයේය ඇදුරු ගුත්තිල.

vii. ඔළමොළ <u>රුපුසෙන්</u> පුරයට <u>වදිති</u>.

viii. <u>කාන්තාවෝ</u> <u>තුමූ</u> විසිතුරු දසුන් මවමින් සරඹ සංදර්ශන <u>පෑහ</u>.

ix. <u>මද්‍රිදේවී</u> දරුදෙදෙනා නොදක <u>හැඬුහ</u>.

x. <u>මම</u> ද නුඹ ද ප්‍රියදර්ශනී ද විභාගයට පාඩම් <u>කරමු</u>.

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි)

oooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooooo